www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජාත්‍යන්තර බැංකු දැවැන්ත ලාභ ඉපැයීමට අර්බුදය ගසාකයි

International banks exploit the crisis to reap massive profits

2009 ජූලි 31

සතිය මුලදී ජර්මනියේ ඩොයිෂෙ බැංකුව සිය ලාභය පිම්මකින් ඉහල නැගි බව නිවේදනය කලේය. පසුගිය වසරේ එම කාලය තුලම යුරෝ මිලියන 645 ක්වූ එහි ඉපැයීම් දෙගුනයක් තරම් ඉහල නගිමින් මෙම වසරේ දෙවන කාර්තුවෙහි බැංකුව වාර්තා කල දල ලාභය යුරෝ බිලියන 1.1 ක් විය.

එක්සත් ජනපදයේ ගෝල්ඩ්මන් සැක්ස් හි වාර්තාගත ඉපැයීම්වලින් පසුව, ඩොයිෂෙ බැංකුව මෙසේ ඉහල ලාභ වාර්තා කලේය. දෙසතියකට පෙර එක්සත් ජනපද ආයෝජන බැංකුව, දෙවන කාර්තුව සඳහා යුරෝ බිලියන 2.44 ක් නොහොත් එක්සත් ජනපද ඩොලර් බිලියන 3.44 ක ලාභයක් පෙන්නුම් කලේය.

ලෝකයේ සමස්ත ධනයෙන් සියයට 40 ක් බවට ගනන් බැලූ වටිනාකම් අතුගා දමමින් ලෝකය පුරා ආර්ථිකයන් විනාශයට පත්කල මූල්‍ය අර්බුදය හටගැනීමෙන් වසරකටත් අඩු කාලයක් තුල, ප්‍රධාන බැංකු හා ආයෝජන ආයතන ගනනාවක් වාර්තාගත ලාභ උපයමින් සමහර තත්ත්වයන්හි දී වාර්තාවන් ලෙස සටහන් කෙරුනු ඉහල මුදල් සම්භාරයන් තම විධායකයන්ගේ වැටුප් හා ප්‍රතිලාභ සඳහා පසෙකට කර ගත්හ.

2008 වසරේ දී ඩොයිෂෙ බැංකුව එහි ඉතිහාසයේ විශාලතම පාඩුව වූ යුරෝ බිලියන 3.9 ක් නොහොත් ඩොලර් බිලියන 5.5 ක් වාර්තා කලේය. මෙම ආපසු හැරීම විස්තර කල හැක්කේ කෙසේ ද? " කැදරකම යලි සැපත්වෙයි-බැංකු ගෝලීය සූදු පොල යලි විවෘත කරයි" යන තේමාව යටතේ ඩර් ස්පීගල් සඟරාවේ මෑතක පලවූ ලිපියකින් මෙයට යම් එලියක් විහිදුවයි. ප්‍රමුඛ පෙලේ හිටපු මූල්‍ය කලමනාකරුවෙකුගෙන් ලිපිය උපුටා දක්වයි. "වසර කිහිපයකට පෙර ආයෝජන බැංකු ධනවත් වූයේ සිය ගනුදෙනුකරුවන්ගේ පිහිටෙන්ය. එම උල්පත වඩා සිහින් වීමට පටන් ගත් කල ඒවා තම කොටස් හිමියන්ගේ මුදල් වෙත යොමු විය. දැන් ඔවුන් ලෝකයට පිලිගැන්විය හැකි විශාලතම මුදල් තටාකය වන, බදු ගෙවන්නන්ගේ මුදල් වලට අතදමා තිබේ."

ලිපිය උපුටා දැක්වීම් කලේ ජාත්‍යන්තර ආයෝජන බැංකුවක ජර්මානු කටයුතු පිලිබඳ ප්‍රධානියාගෙන් ය. "සූදුපොලේ කැට සඳහා බදු ගෙවන්නා මුදල් වියදම් කරයි. ඊටත් වඩා මොනවා ද?"

2008 සැප්තැම්බරයේ ලේමන් බ්‍රදර්ස් බැංකුව බිඳවැටීමෙන් පසුව ඇමරිකානු ආන්ඩුව, දැවැන්ත ඇපදීමේ වැඩසටහනක් සමඟ මැදිහත් විය. එතැන් පටන් ආන්ඩුව ඩොලර් ට්‍රිලියන 23.7 ක් තරම් වූ එනම් ඇමරිකාවේ දල දේශීය නිෂ්පාදනය මෙන් 1.7 ගුනයක මුදල් සම්භාරයක් යෙදවීමේ විභවය සහිත වැඩ සටහන් සඳහා මූලිකත්වය ගත්තේය.

වොෂින්ටනය විසින් ගන්නා ලද පියවර ලෝකය පුරාම ආන්ඩු අනුකරනය කලේය.

බැංකුකරුවන්ගේ, විශේෂයෙන් ම ඩොයිෂෙ බැංකුවේ, ප්‍රධාන විධායක ජෝසෆ් ඇකර්මන්ගේ බලපෑම යටතේ ජර්මානු ආන්ඩුව පසුගිය වසර අවසානයේ යුරෝ බිලියන 500 ක බැංකු ගොඩදැමීමේ වැඩසටහනක් දියත් කලේය. එතැන් පටන් ආන්ඩුව, සිය "නරක බැංකු" යෝජනා ක්‍රමයේ කොටසක් ලෙස, අතිරේක බිලියන සිය ගනනක් සඳහා පෙරොන්දු දී තිබේ.

2008 සැප්තැම්බරයේ මූල්‍ය අර්බුදය පුපුරා ගිය තැන් පටන් ආන්ඩු විසින් ලෝක දදේනි න් සියයට 30 ක් පමන වන ඩොලර් ට්‍රිලියන 18 ක මහජන අරමුදල්, බැංකු පද්ධතිය ප්‍රතිමූල්‍යකරනය සඳහා යෙදවීමට කැපවී සිටියි. ප්‍රධාන කාර්මික රටවල් සියල්ලේම පාහේ, " ආයතන ක්‍රමානුකූලව යථාවත් කිරීමේ" ඉරනමට මුහුනපා සිටි ප්‍රධාන බැංකු හා මූල්‍යායතන වලට, ඒවායේ අදාල භාන්ඩාගාර විසින් මෙසේ හිස් චෙක්පත් නිකුත් කර තිබේ.

ජාතික ආන්ඩු විසින් ක්‍රියාත්මක කල ඇප දීමේ වැඩසටහන් බෙහෙවින්ම සමපේක්ෂනාත්මක වූ මූල්‍ය ගනුදෙනු වලට යලි වතාවක් ප්‍රවිෂ්ට වීමට ඉඩ සැලසෙන පරිදි, බැංකු වලට සැපයූ දැවැන්ත ආරක්ෂක දැලක් වැනිය. බැංකු මුදාගැනීමේ හා අනෙකුත් යෝධ

ආර්ථික උත්තේජක වැඩසටහන් වල ප්‍රතිපල වශයෙන් කඳුගැසී ඇති නය කන්දරාව ගෙවීමට තවත් පරම්පරා ගනනාවක් ගතවනු ඇත.

ඒ සමග ම, ආන්ඩු විසින් වේගයෙන් සමුච්ඡය කරගත් නය මගින්, බැංකු සඳහා විශාල හා ලාභදායී අවස්ථා විවෘතවී තිබේ. මුදා ගැනීමේ මූල්‍ය ගොනුවලට බැඳුනු ආන්ඩුවල නය ගනුදෙනු කිරීම, විශාල බැංකු වල ප්‍රධාන කර්තව්‍ය ලෙස මතුවෙමින් තිබේ.

යුරෝපා සංගමයේ ආන්ඩුවල නයෙහි සාමාන්‍යය, මෙම වසරේ දී දදේනි න් සියයට 80 දක්වා ද 2010 වසරේ දී ඊටත් එහාට ද වැඩිවනු ඇතැයි සැලකේ. බ්‍රිතාන්‍යය ආන්ඩුවේ නය 2009 වසරේ දී දදේනි සියයට 100 කරා ද, 2011 වසර වන විට ජපානයේ එය සියයට 200 දක්වා ද, එක්සත් ජනපදයේ ඒ කාලයට ම සියයට 100 දක්වා ද ඉහල නගිතැයි අපේක්ෂා කරයි.

ලොව පුරාම නය මට්ටම් ඉහල නගිද්දී, වර්ගීකරන ආයතන ඒ ඒ රටවලට නයදීමේ තත්ත්වය පහත දමන අතර එම රටවලට නය ගැනීමේ දී ඉහල බැංකු පොලියක් ගෙවීමට සිදුවෙයි. බැංකු සඳහා මෙය ආකර්ශනීය "දිනන-දිනන" තත්ත්වයකි.

ඒ සමග ම බැංකු, ව්‍යාපාරයන්හි අයෝජනය කිරීම සීමා කරති. මක්නිසා ද යත්, ඔවුන් වක්‍රෝක්තියෙන් කියන පරිදි "වත්මන් මූල්‍ය වාතාවරනය තුල " සාමාන්‍ය සමාගම්වල හා කාර්මික ව්‍යවසායන්හි අනාගතය "අවදානම් වැඩි" නිසාය. බැංකු නය පහසුකම් පුලුල් නොකිරීමේ තත්ත්වය හමුවේ කාර්මික හා වානිජ්‍ය සමාගම් වලට ව්‍යාපාර බැඳුම්කරයන් වඩා ඉහල මට්ටමේ පොලියක් මත අලෙවි කිරීමට සිදුවෙයි. මෙම බැඳුම්කර ගනුදෙනුවේ දී සමපේක්ෂනය මගින් බැංකු වලට තව තවත් ලාභ ලැබිය හැකිය.

*ඩර් ස්පීගල් ලිපියට* අනුව "ප්‍රාග්ධන වෙලඳපොලවලින් ආරම්භවූ වත්මන් අර්බුදය, යලි වතාවක් ප්‍රාග්ධන වෙලඳපොල ශක්තිමත් කරමින් තිබීම ගැඹුරු උත්ප්‍රාසයකි. බැඳුම්කර නිකුතුව පුපුරන සුලු පරිමානයක් අත්කර ගෙන තිබේ. බැංකු ඇතුලත් නොවන, මහාද්වීපික යුරෝපා සමාගම් පමනක් මේ වසරේ පලමු සය මාසය තුල බැඳුම්කර අලෙවිය මඟින් ඩොලර් බිලියන 318 ක් නයට ගෙන තිබේ. මෙය දල වශයෙන් පසුගිය තෙවසරේ සාමාන්‍ය මෙන් සියයට 50 ක වැඩිවීමකි."

බැංකු ලාභවල දැවැන්ත වර්ධනය, බැංකුකරුවන්ගේ වැටුප්වල පුපුරන සුලු වර්ධනයක් පිලිබඳ පොරොන්දුවකි. ජොන්සන් ඇසෝසියේට්ස් නම් උපදේශක සමාගමේ ගනන් බැලීමට අනුව, මේ වසරේ බැංකු කර්මාන්තය පුරා සාමාන්‍ය වැටුප් වැඩිවීම් සියයට 20-30 අතර වනු ඇත.

ගෝල්ඩ්මන් සැක්ස්හි ඉතිහාසයේ වැඩිම වාර්ෂික වන්දි ප්‍රධානය සේ සැලකෙන ඩොලර් 770,000 ක සාමාන්‍යයකින් යුත් ප්‍රතිපුරනයක්, මේ වසර තුල එහි සේවකයන්ට ගෙවීම සඳහා දැන් සූදානම් කර ඇත.

බැංකුවේ වත්කම් මත, බිලියන 300 කට අධික වටිනාමකමකින් යුත් ආන්ඩුවේ සහතික ද සමඟ බිලියන 45 ක මුදල් හිමිකරගත් සිටිගෲප්, පහත් ප්‍රතිලාභවලට හිලව් වශයෙන් වසර තුල සියයට 50 කින් වැටුප් වැඩිකිරීමට සැලසුම් කර ඇත. දැන් බැංකුවෙන් සියයට 34 ක් ආන්ඩුව සතු ය. යූබීඑස් හා මෝගන් ස්ටැන්ලි ඇතුලු අනෙකුත් බැංකු ද තම සේවකයන්ගේ වැටුප් සියයට 30-60 අතර ප්‍රමානයන්ගෙන් වැඩිකිරීමට යයි.

බංකොලොත් වීමෙන් ගැලවී සිටීම සඳහා බිලියන් ගනන් රාජ්‍යාධාර ලබාගත් ජර්මනියේ බෙයර්න්එල්බී යන බැවේරියානු රාජ්‍ය බැංකුවේ ප්‍රධානියා වන මයිකල් කෙමර්, සිය බැංකු සේවකයන්ට "අභිප්‍රේරන" ප්‍රතිලාභ ගෙවීම පිලිබඳ සිය සැලසුම් සුජාත කලේය.

මෙම අති විශාල වන්දි වැඩසටහන්, ඩොලර් දශ ලක්ෂ ගනනින් වැටුප් හා ප්‍රතිලාභ අපේක්ෂවෙන් සිටින ඉහල විධායකයන්ට හා වෙලඳුන්ට අසමානුපාතිකව හිමිවනු ඇත.

මුදල් ඉපැයීම සඳහා ලැබී ඇති පෙර නොවූ විරූ අවස්ථාවන්, ගෝල්ඩ්මන් සැක්ස්, ජේපීමෝගන් චේස් හා ඩොයිෂෙ වැනි ප්‍රධාන බැංකු විසින් සිය තරගකරුවන් සිතා මතාම අතුගා දැමීමේ ප්‍රහාරාත්මක උපායන් සඳහා යොදා ගනිමින් සිටිති.

ජුලි 29 වන දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි වාර්තාකල පරිදි, ඩොයිෂෙ බැංකුවේ ප්‍රධානියා වන ඇකර්මන් ලෝකය පුරා ආන්ඩු විසින් බැංකු වෙනුවෙන් ඉටුකල සේවය කෙරෙහි සිය ප්‍රනාමය පුද කල අතර, ලෝකයේ ප්‍රමුඛ මූල්‍යායතනවල ආසක්තයන් ඉටුකිරීමේ එම ආන්ඩුවල උත්සාහය දෙගුන තෙගුන කරන ලෙස ඉල්ලා සිටියේ ය.

වත්මන් අර්බුදයේ වගකීම බැංකු ප්‍රජාව විසින් භාරගත යුතුය යන චෝදනාව පසෙකට දැමූ ඇකර්මන්, කුඩා බැංකු පිහිටුවීම දෙසට තබන කුමන හෝ පියවරක් පලදායී නොවනු ඇතැයි ප්‍රකාශ කලේය. ඒ වෙනුවට ඔහු ඉල්ලා සිටියේ "සංකීර්න ගෝලීය මූල්‍යායතනවල, " එනම් ඩොයිෂෙ බැංකුව වැනි ප්‍රධාන බැංකුවල, අවශ්‍යතා ආරක්ෂා කිරීමේ නව පියවර ගන්නා ලෙසයි.

ඩොයිෂෙ බැංකුවේ ප්‍රමුඛ ආයෝජන බැංකු කරුවෙක් වන ඇන්ෂු ජයින් බ්‍රිතාන්‍යයේ *යුරෝමනි* සඟරාවට පසුගිය මැයි මාසයේදී ප්‍රකාශ කොට තිබුනේ "අනාගතයේදී අපට දකින්නට ලැබෙන්නේ ආයෝජන බැංකු ක්‍රමය තුල බැරෑරුම් ගෝලීය බැංකු පහක් හෝ හයක් පමනක්" බවය.

*ඩර් ස්පීගල්* ට අනුව, මෙම යෝධ ආයෝජන බැංකු ප්‍රභූව, රාජ්‍ය භාන්ඩාගාරයන්ට හා බදු ගෙවන්නන්ගේ සාක්කු වලට අතපෙවීමේ පෙර නොවූ විරූ හැකියාවක් සහිත, නව "සීමිත තරඟකාරී" මූල්‍ය ක්‍රමයක් අන්තර්ගත කරගනු ඇත. වෙන කවර කලකටත් වඩා බැංකු, ආන්ඩුවක සුවිශේෂී දේශපාලන පැහැය නොතකා රාජ්‍ය ප්‍රතිපත්ති අනවනු ඇත. වොෂින්ටනයේ, බර්ලිනයේ හා ලන්ඩනයේ තානය කියාදෙනු ඇත්තේ බැංකුකරුවන් හා ඔවුන්ගේ අන්තේවාසිකයන් විසින්ය.

ගෝල්ඩ්මන් සැක්ස්, ජේපීමෝගන් චේස් හා ඩොයිෂෙ බැංකු ප්‍රධාන විධායකයින් වැඩිකොටම තමන් වගකිව යුතුව ඇති වත්මන් අර්බුදය සලකන්නේ, තමන්ට පැදුනු අවස්ථාවක් ලෙසය. ඔවුන් එය යහමින් ගසාකති. කම්කරු පන්තිය සඳහා මෙහි අර්ථය වන්නේ, ශ්‍රම සූරාකෑම ඉමහත් ලෙස උත්සන්න කිරීමත්, සියවසකටත් වැඩි කාලයක අරගල වලින් දිනාගත් ඉතිරිව ඇති සමාජ සහන වැනසී යාමත් ය.

ලොව වටා අග නගරයන්හි ආන්ඩු සමාජ ප්‍රති විප්ලවයක් සූදානම් කරමින් සිටිති. වෝල් වීදියේ ලාභ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි මෝටර් රථ කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමට ධවල මන්දිරයේ මැදිහත් වීමත්, ඔබාමාගේ සෞඛ්‍ය පහසුකම් යෝජනා ක්‍රමයේත් වැදගත්කම පවතින්නේ මෙහිය.

මාස කිහිපයක් තුල ෆෙඩරල් මැතිවරනයකට මුහුනපා සිටින ජර්මන් ආන්ඩුවට, වඩා පරිස්සම් සහගත වීමට සිදුව තිබේ. එසේ වෙතත් දැනටමත් පැහැදිලි වී ඇත්තේ, තත්ත්වාරක්ෂක පක්ෂ හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මහම හවුල, ඕපල් වැනි ප්‍රමුඛ කාර්මික සමාගම් බංකොලොත් වීමට ඉඩ හරිමින් මේ වන විටත්, රටේ ශුභසාධන හා විශ්‍රාමික වැඩ සටහන් මත සුවිශාල ප්‍රහාර එල්ල කිරීමේ සැලසුම් සූදානම් කර තිබෙන බවයි. ඒවා මැතිවරනය අවසන් වූ වහාම ක්‍රියාවට නැගෙනු ඇත.

ගෝලීය මූල්‍ය සුදුපොල තව තවත් විනාශකාරී ආර්ථික හා සමාජ කම්පනයන් ගේ අන්තරාය මතු කරයි. ලෝක ආර්ථිකයේ පාලනය ඇකර්මන් සහ සමාගම අතට පත්වුවහොත් මනුෂ්‍ය වර්ගයා මුහුන දෙන්නේ ව්‍යසනයකටය. සැලසුම් සහගත සමාජවාදී ආර්ථිකයක අවියෝජනීය අංගයක් ලෙස, ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් ප්‍රධාන මූල්‍ය ආයතනවල ප්‍රජාතන්ත්‍රීය අයිතිය හා පාලනය සියතට ගැනීම පෙර කවර කාලයකටත් වඩා අද දැවෙන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

**ස්ටෙෆන් ස්ටේන්බර්ග්**

© www.wsws.org